**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2013**

**------------------------------------------------------------------------------------------------------------------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය, 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති**

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ට අනුකූලව වත්කම් සාධාරණ අගයට වාර්තා කළයුතු වුවත් දැනට භාවිතයට ගන්නා සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.65,873,657ක් වටිනා ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.133,280ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලට ගැනීමේදී ඒ සඳහා ආයතනය සතු ඡායා පිටපත් යන්ත්‍රයක් රු.20,000කට හුවමාරු කර ඇතත්, ශුද්ධ වෙනස පමණක් ගිණුම්ගත කිරීම.

(ආ) සේවකයන් වෙත විකුණා තිබූ ස්ථාවර වත්කම් අයිතම් 39ක් ගිණුම් වලින් ඉවත්කිරීමට කටයුතු නොකර ලද මුදල වන රු.113,050 පමණක් ආදායම ලෙස ගිණුම්ගත කිරීම.

**2.2.3 දීර්ඝකාලීනව සැසඳුම් නොකළ ශේෂ**

දීර්ඝ කාලයක සිට නිරවුල් නොකරන ලද ජාත්‍යන්තර ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් රු.2,911,912 ක් හා රු.11,603,217ක් තහවුරු කර ගැනීම සඳහා උපලේඛන නොමැතිවීම හේතුවෙන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751 හා 756 | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් පවත්වා නොතිබුණු අතර, භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය | විශ්වවිද්‍යාල පද්ධතියේ භාවිතා කරන වැටුප් හා දීමනා වලින් බැහැරව විවිධ ක්ෂේත්‍ර සඳහා කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් 08 දෙනෙකු පත් කර තිබුණු අතර, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව වැටුප්, දීමනා හා වැටුප් වර්ධකයන් ලබාදී තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2013 වර්ෂය තුළ පුහුණු පාඨමාලා 08ක් පවත්වා තිබූ අතර, ඉන් 06 ක ශුද්ධ අතිරික්තය වූ රු.9,031,575ක මුදලින් රු.7,036,900ක් විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය අතර බෙදා දී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.40,784,288 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 41,736,535 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම රු.952,247 ක් විය.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

ආයතනය විසින් හිටපු අධ්‍යක්ෂ විසින් සිදු කර ඇති රු. මිලියන 50 ක පමණ වූ මූල්‍ය අක්‍රමිකතාව අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර, හිටපු මූල්‍යාධිකාරී විසින් ආයතනයට විරුද්ධව රු.මිලියන 30ක වන්දි ඉල්ලා නඩු පවරා තිබුනද, මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 281ක් විය. ආයතනය පශ්චාත් උපාධි පාඨමාලා 5 කට අදාළව සිසුන් 419 දෙනෙකු වෙත 2013 වර්ෂය තුළදී උපාධි පිරිනමා තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රොපෙෂනල් මැනේජර් සහ ශ්‍රී ලංකා ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් සඟරා විකිණීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු.536,004 ක් වැය කර තිබුණද කිසිදු සඟරාවක් බාහිර පාර්ශවයන් විසින් මිලදී ගෙන නොතිබුණි.

(ආ) ආයතනය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.350,000 ක මුදලක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය වෙත ප්‍රදානයක් ලෙස ලබාදී තිබුණි.

(ඇ) ආයතනයේ පවත්වාගෙන යනු ලබන කළමනාකරණ සුබසාධක සංගමය වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අරමුදලින් රු.2,600,000 ක මුදලක් මාරු කර එම මුදලින් රු.1,964,925ක් කාර්ය මණ්ඩලය වෙත ආහාර දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) 2012 වර්ෂය තුළ පුද්ගලික සමාගමක් වෙත වත්කම් කළමනාකරණය පිළිබඳ මෘදුකාංග පද්ධතියක් සකස් කරවා ගැනීම සඳහා රු.250,000 ක් ගෙවීම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

ප්‍රකාශන තොග සම්බන්ධයෙන් විගණනයේදී සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.368,679 ක් වටිනා පොත් 547 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පරිපාලනය
(ආ) තොග පාලනය
(ඇ) පිරිස් කළමනාකරණය